original

# නව ලංකා නිදහස් පක්ෂ ව්‍යවස්ථාව

2023.05.12 - සංශෝධිත



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

# නව ලංකා නිදහස් පක්ෂය

## අරමුණු හා ප්‍රතිපත්ති

නව ලංකා නිදහස් පක්ෂයේ මූලික අරමුණ සමාජ ප්‍රජාතාන්ත්‍රික රාජ්‍යයක් ශ්‍රී ලංකාව තුළ නිර්මාණය කිරීම සඳහා දේශපාලනික වශයෙන් ප්‍රජාතාන්ත්‍රිකව සංවිධානගත වීමයි. නිෂ්පාදනයට ප්‍රමුඛතාවය දෙන දේශීය ආර්ථිකයක් සහ නොබැඳි විදේශ ප්‍රතිපත්ති මගින් ස්වදේශික සංහිඳියාවක් ඇති කරමින් අපේ මව්බිම "දියුණු රටක්" බවට පත් කිරීම අපේ ප්‍රතිපත්තියයි.

## 1 වන වගන්තිය

i. පක්ෂයේ නම "නව ලංකා නිදහස් පක්ෂය" වෙයි.
ii. පක්ෂයේ මැතිවරණ සළකුණ "හාවා" වෙයි.
iii. වර්ණය "තද නිල්" වෙයි.
iv. පක්ෂයේ ප්‍රධාන කාර්යාලය "අංක 114, කෙලින් විදිය, බත්තරමුල්ල" දරණ ස්ථානයේ පිහිටුවා ඇත.

## 2 වන වගන්තිය

### 2.1 නව ලංකා නිදහස් පක්ෂය පහත සංවිධාන වලින් සමන්විත වෙයි

i. ශාඛා සමිතිය.
ii. ප්‍රාදේශීය බල මණ්ඩලය.
iii. මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය (ආසන මධ්‍ය සංවිධානය).
iv. දිස්ත්‍රික් සංවිධානය.
v. සමස්ත ලංකා කාරක සභාව.
vi. විධායක කාරක සභාව.
vii. මධ්‍යම කාරක සභාව.

### 2.2 විශේෂ සංවිධාන

i. උපදේශක සභාව / බුද්ධි මණ්ඩලය.
ii. විනය මණ්ඩලය.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

16

iii. කාලීන මෙහෙයුම් කමිටු නිශ්චිත කාල සීමාවන් වෙනුවෙන්, පක්ෂ සභාපතිගේ උපදෙස් මත මධ්‍යම කාරක සභාව විසින් පත් කළ හැකිය.

### 2.3 අනු සංවිධාන

i. නව ලංකා නිදහස් තරුණ සංවිධානය.
ii. නව ලංකා නිදහස් කාන්තා සංවිධානය.
iii. නව ලංකා නිදහස් සේවක සංගමය (රාජ්‍ය අංශය සහ පෞද්ගලික අංශය).

### 2.4 අනුබද්ධ සංවිධාන

i. නව ලංකා නිදහස් ගුරු සංවිධානය.
ii. නව ලංකා නිදහස් වෘත්තියවේදීන්ගේ සංවිධානය, (වෛද්‍ය / ඉංජිනේරු / ගණකාධිකාරි ඇතුලු විවිධ වෘත්තිය ක්ෂේත්‍ර වල නියුතු වූවන්).
iii. නව ලංකා නිදහස් ගොවි සංවිධානය.
iv. නව ලංකා නිදහස් නීතිඥ සංවිධානය.
v. නව ලංකා නිදහස් සංස්කෘතික හා කලා සංවිධානය.
vi. නව ලංකා නිදහස් ශිෂ්‍ය සංවිධානය.
vii. මධ්‍යම කාරක සභාවේ තීරණය පරිදි වෙනත් ක්ෂේත්‍ර සඳහා ද අනුබද්ධ සංවිධාන පිහිටුවිය හැකිය.
viii. විශ්‍රාමික සේවා සංවිධානය

## 3 වන වගන්තිය

### 3.1 ශාඛා සමිතිය

i. මෙය පක්ෂයේ බිම් මට්ටමේ සංවිධානය වේ.
ii. ග්‍රාමසේවා කොට්ඨාශ මට්ටමින් හා සම්මත ගම්මාන මට්ටමින් ශාඛා සංවිධාන පිහිටුවිය හැකිය.
iii. ශාඛා සමිතියක් පිහිටුවීම සඳහා අවම සාමාජිකයන් විස්සක් (20) අවශ්‍ය වේ.
iv. ග්‍රාම නිලධාරි වසමක හෝ සම්මත ගම්මානයක පිහිටුවා ගන්නා ලද ශාඛා සමිතියට අමතරව වෙනත් ශාඛා සංවිධානයක් පිහිටුවන්නේ නම්, මධ්‍යම කාරක සභාවේ පූර්ව අනුමැතිය ගත යුතු වේ.
v. උසස් අධ්‍යාපන ආයතන සහ විදේශ රටවල ශාඛා සමිති පිහිටුවිය හැකිය.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

(15)

### 3.2 ශාඛා සමිති නිලධාරීන්

1 පහත සදහන් නිලධාරි මණ්ඩලය ශාඛා සමිති රැස්වීමක දී තෝරා ගත හැකිය,

i. සභාපති
ii. ලේකම්
iii. උප සභාපති
iv. උප ලේකම්
v. භාණ්ඩාගාරික
vi. කාරක සභාව (10 දෙනෙක්)

2 ගමේ ජීවත් වන ප්‍රභූන් අනුශාසකවරුන් ලෙස පත් කර ගත හැකිය. අනුශාසකවරුන් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගැනීම අනිවාර්ය නොවේ.

3 ශාඛා සමිතියේ සංයුතිය සකස් වීමේදි වැඩිහිටි, පිරිමි, කාන්තා සහ තරුණ යන කණ්ඩායම් නියෝජනය වන පරිදි පත්කර ගැනීම සුදුසුය.

## 4 වන වගන්තිය

### 4.1 ප්‍රාදේශිය බල මණ්ඩලය

i. පළාත් පාලන ආයතන බල ප්‍රදේශයක් සඳහා ප්‍රාදේශිය බල මණ්ඩලයක් පිහිටුවා ගත හැකිය.

ii. ප්‍රාදේශිය බල මණ්ඩල සාමාජිකයින් වන්නේ අදාළ බල ප්‍රදේශයේ පදිංචි පාර්ලිමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන නියෝජිතයින් සහ එම ප්‍රදේශයේ ශාඛා, කාන්තා, තරුණ සංවිධානයන්හි ප්‍රධාන නිලධාරීන් සහ අනුබද්ධිත හා වෘත්තිය සමිති සංවිධාන වල නායකයින්ය.

iii. ප්‍රාදේශිය බල මණ්ඩලයේ සභාපතිවරයා ආසන සංවිධායකවරයා හෝ ඔහුගේ කැමැත්ත මත වෙනත් අයෙකු වන අතර, සෙසු තනතුරු සඳහා ප්‍රාදේශිය බල මණ්ඩල සාමාජිකයින් අතරින් පත්කර ගත යුතුය.

iv. ප්‍රාදේශිය බල මණ්ඩලය මාස තුනකට (03) වරක් රැස්විය යුතු අතර, අදාළ වාර්තා පක්ෂ ලේකම්වරයා වෙත ඉදිරිපත් කල යුතුය.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

## 4.2 මැතිවරණ බලප්‍රදේශ සංවිධානය / ආසන මධ්‍ය සංවිධානය

### අ) සංයුතිය

i. පක්ෂයේ සභාපති විසින් සෑම මැතිවරණ බල ප්‍රදේශයකටම සංවිධායකවරයෙකු පත් කළ යුතුය. එම සංවිධායකවරයා නිළ බලයෙන්ම අදාල මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ සභාපතිවරයා වන්නේය,

ii. අදාළ මැතිවරණ බල ප්‍රදේශය තුළ පිහිටුවා ඇති පක්ෂ ශාඛා සමිති වල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික තනතුරු දරන්නන්,

iii. අදාළ මැතිවරණ බල ප්‍රදේශය තුළ පදිංචි පක්ෂයේ පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජිතයින්,

iv. මෙම ව්‍යවස්ථාවේ 2.3 සහ 2.4 අනු ව්‍යවස්ථාවන්හි සඳහන් පක්ෂයේ අනු සංවිධාන සහ අනුබද්ධ සංවිධාන වල ආසන බල මණ්ඩල සභාපති, ලේකම් සහ භාණ්ඩාගාරික.

### ආ) බලතල හා වගකීම්

i. මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය සඳහා ලේකම්, භාණ්ඩාගාරික, උප සභාපතිවරු තිදෙනෙක් (03), උප ලේකම්වරු තිදෙනෙක් (03) සහ කාරක සභිකයින් දස දෙනෙකු (10) මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ සාමාජිකයින් අතරින් පත්කර ගත යුතුය.

ii. උප ලේකම්වරු තිදෙනාගෙන් එක් අයෙකුට සංවිධායකවරයාගේ අධීක්ෂණයට යටත්ව සමාජ මාධ්‍ය කටයුතු පැවරිය යුතුය.

iii. අදාළ මැතිවරණ බල ප්‍රදේශය තුළ විවිධ වැඩසටහන් මගින් පක්ෂයේ කටයුතු ප්‍රවර්ධනය කිරීම මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ වගකීම වෙයි.

iv. මැතිවරණ කාල සීමාවන් ඇතුලුව, ඕනෑම අවස්ථාවකදී පක්ෂයේ මධ්‍යම කාරක සභාවෙන් ලැබෙන උපදෙස් පරිදි කඩිනමින් එම උපදෙස් ක්‍රියාත්මක කළ යුතුය.

v. මැතිවරණ බල ප්‍රදේශ සංවිධානය මාස හයකට (06) වරක්වත් රැස්විය යුතුය.

vi. ආසන සංවිධායක විසින් හෝ සංවිධායකගේ උපදෙස් පරිදි මධ්‍ය සංවිධාන ලේකම් විසින් හෝ මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ රැස්වීම් කැඳවිය යුතුය.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

vii. පක්ෂයේ සභාපතිවරයා, ලේකම්වරයා හෝ පක්ෂයේ මධ්‍යම කාරක සභිකයින් අතරින් පක්ෂ සභාපතිවරයා විසින් නම් කරන නියෝජිතයෙකුගේ ප්‍රධානත්වයෙන් මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ නිලවරණය පැවැත්විය යුතු අතර එම නිලවරණයේ වාර්තාව සහ සහභාගිවූවන්ගේ අත්සන් ලේඛනය නිලවරණය පැවැත්වූ දිනයේ සිට දින දාහතරක් (14) ඇතුලත පක්ෂ මූලස්ථානයේ ලේකම් කාර්යාලය වෙත භාරදිය යුතුය.

## 4.3 දිස්ත්‍රික් සංවිධානය (දිස්ත්‍රික් බල මණ්ඩලය)

i. සෑම පරිපාලන දිස්ත්‍රික්කයක් සඳහාම දිස්ත්‍රික් බල මණ්ඩලයක් පිහිටුවා ගත යුතුය.

ii. අදාළ දිස්ත්‍රික්කයේ ආසන සංවිධායකවරුන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්, පළාත් සභා මන්ත්‍රීවරුන්, ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්, මැතිවරණ බල ප්‍රදේශ සංවිධානයේ නිලධාරීන්, ප්‍රාදේශීය බල මණ්ඩලයේ නිලධාරීන් සහ පක්ෂයේ සියලුම අනුබද්ධ හා වෘත්තිය සමිති දිස්ත්‍රික් සභාපති සහ ලේකම් දිස්ත්‍රික් සංවිධානයේ සාමාජිකයින් විය යුත්තේය.

iii. පක්ෂයේ සභාපතිවරයා විසින් ආසන සංවිධායකවරුන් අතරින් පත්කරනු ලබන දිස්ත්‍රික් නායකයා දිස්ත්‍රික් බල මණ්ඩලයේ සභාපතිවරයා වන්නේය.

iv. දිස්ත්‍රික් බල මණ්ඩල ලේකම්, භාණ්ඩාගාරික, කාරක සභාව සෙසු සාමාජිකයින් අතරින් පත්කර ගත යුත්තේය.

v. සෑම ආසන සංවිධායකවරයෙකුම කාරක සභාවට ඇතුළත් වන පරිදි කාරක සභාව පත්කර ගත යුතු වන්නේය.

vi. දිස්ත්‍රික් බල මණ්ඩලය අවම වශයෙන් සෑම මාස හයකට (06) වරක් රැස්විය යුතුය.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

## 5 වන වගන්තිය

**සමස්ත ලංකා කාරක සභාව**

**සංයුතිය සහ වගකීම්**

i. පක්ෂයේ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන නියෝජිතයින්,

ii. පක්ෂයේ මැතිවරණ බල ප්‍රදේශ සංවිධායකවරුන් සහ ප්‍රාදේශීය සංවිධායකයින් සෑම දිස්ත්‍රික්කයකින්ම දෙදෙනා බැගින්,

iii. පක්ෂයේ තරුණ සංවිධානය විසින් සෑම දිස්ත්‍රික්කයකින්ම දෙදෙනෙකු බැගින් පත්කර එවනු ලබන පණස් දෙනෙකුට (50) නොවැඩි පිරිසක් සහ පක්ෂයේ කාන්තා සංවිධානය විසින් සෑම දිස්ත්‍රික්කයක්ම නියෝජනය වන පරිදි පත්කර එවනු ලබන තිස් දෙනෙකුට (30) නොවැඩි පිරිසක්,

iv. පක්ෂයේ වෘත්තීය සමිති වලින් රාජ්‍ය අංශයෙන් විස්සකට (20) නොවැඩි සහ පුද්ගලික හා අර්ධ රාජ්‍ය අංශයෙන් තිහකට (30) නොවැඩි නියෝජිත පිරිසක්,

v. පක්ෂයේ සභාපතිවරයා විසින් පත්කරනු ලබන පණහකට (50) නොවැඩි පිරිසක්,

vi. මෙම ව්‍යවස්ථාවේ 2.4 අනු ව්‍යවස්ථාවේ සඳහන් අනුබද්ධ සංවිධාන වලින් පත්කර එවනු ලබන එකකින් දස දෙනෙකුට (10) නොවැඩි පිරිසක්,

vii. පක්ෂයේ සමස්ත ලංකා කාරක සභාව සෑම වසරකට වරක් හෝ පක්ෂයේ සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන දිනයකදී කැඳවිය යුතුය.

viii. ජාතික වශයෙන් වැදගත්වන කිසියම් කරුණක් පිළිබඳව තීන්දු කිරීමේදී පක්ෂයේ සමස්ත ලංකා කාරක සභාවේ අදහස විමසිය යුතු යැයි පක්ෂ සභාපතිවරයා සිතන්නේ නම් එවැනි අවස්ථාවක සමස්ත ලංකා කාරක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවන ලෙස ලේකම්වරයාට උපදෙස් දීමට සභාපතිවරයාට හැකිය. එවන් විශේෂ රැස්වීමක් කැඳවීමේදී ඊට අදාල කරුණ එකී කැඳවීම් ලිපියේ සඳහන් කිරීමට ලේකම්වරයා වග බලාගත යුතුය.

ix. ඕනෑම මැතිවරණයක් සඳහා පක්ෂය විසින් නාමයෝජනා භාරදීමෙන් පසු එකී නාමයෝජනා භාර ගැනීම අවසන් වන දිනයේ සිට දින දාහතරක් (14) ක් ඇතුලත සමස්ට ලංකා කාරක සභාව කැඳවා අදාළ නාම යෝජනා පිළිබඳව දැනුවත් කිරීමට පක්ෂ ලේකම්වරයා කටයුතු කළ යුතුය.



අනුර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

## 6 පක්ෂ ව්‍යුහය

### විධායක සභාව

### 6.1 සංයුතිය

i. පක්ෂයේ මැතිවරණ බලප්‍රදේශ සංවිධායකවරුන් සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්.

ii. පක්ෂයේ පළාත් සභා අමාත්‍යවරුන් සහ සභාපතිවරුන්, පක්ෂයේ පළාත් පාලන ආයතන සභාපතිවරුන් / විපක්ෂ නායකවරුන් /ප්‍රාදේශිය සංවිධායකවරුන්/ කණ්ඩායම් නායකයින්.

iii. පක්ෂයේ තරුණ සංවිධානයෙන් නම් කර එවනු ලබන පස් දෙනෙක් (05) සහ කාන්තා සංවිධානයෙන් නම් කර එවන තිදෙනෙක් (03).

iv. පක්ෂයේ වෘත්තිය සමිති නියෝජනය කරන රාජ්‍ය අංශයෙන් තිදෙනෙක් (03) සහ පෞද්ගලික අංශයෙන් පස් දෙනෙකු (05).

v. මෙම ව්‍යවස්ථාවේ 2.4 අනු ව්‍යවස්ථාවේ සඳහන් අනුබද්ධ සංවිධානවලින් නම් කර එවනු ලබන එකකින් දෙදෙනෙකු (02) බැගින්.

vi. පක්ෂයේ අනුශාසකවරුන් නිල බලයෙන්,

vii. පක්ෂයේ සභාපති විසින් සමස්ත ලංකා කාරක සභිකයින් අතරින් පත් කරන තිස් දෙනෙකුට (30) වැඩි නොවන පිරිසක්

### 6.2 බලතල හා වගකීම්

i. විධායක සභාව විසින් පක්ෂයේ පහත දැක්වෙන නිලධාරි මණ්ඩලය පත්කර ගත යුතුය.
   - අ) සභාපති
   - ආ) නියෝජ්‍ය සභාපති
   - ඇ) ප්‍රධාන ලේකම්
   - ඈ) නියෝජ්‍ය ලේකම්
   - ඉ) භාණ්ඩාගාරික
   - ඊ) ජාතික සංවිධායක
   - උ) ජ්‍යෙෂ්ඨ උප සභාපතිවරුන් 04
   - ඌ) උප සභාපතිවරුන් 05
   - එ) උප ලේකම්වරුන් 05



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

10

ii. පක්ෂය මුහුණ දෙන ඕනෑම මැතිවරණයක් සඳහා පක්ෂයේ මැතිවරණ ප්‍රතිපත්ති ප්‍රකාශය පක්ෂයේ මධ්‍යම කාරක සභාවට නිර්දේශ කිරීම විධායක සභාව විසින් කළ යුතුය.

iii. මාස හයකට (06) කට වරක් හෝ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන දිනයක හෝ ලේකම්වරයා විසින් විධායක සභාවේ රැස්වීම් කැඳවිය යුතුය.

iv. පක්ෂයේ ව්‍යවස්ථා සංශෝධන විධායක සභාව විසින් අනුමත කළ යුතුය.

## 7 වන වගන්තිය

**මධ්‍යම කාරක සභාව**

### 7.1 සංයුතිය

i. මෙම ව්‍යවස්ථාවේ 6.2.i. අනු ව්‍යවස්ථාව අනුව පත් කෙරෙන පක්ෂයේ නිලධාරීන්

ii. පක්ෂයේ අනුශාසකවරුන්

iii. පක්ෂයේ තරුණ සංවිධානයේ සහ කාන්තා සංවිධානයේ සභාපතිවරුන්

iv. පක්ෂයේ වෘත්තිය සමිති නියෝජනය කරමින් රාජ්‍ය අංශයේ සහ පෞද්ගලික අංශයේ ලේකම්වරුන්

v. පක්ෂයේ සභාපතිවරයා විසින් විධායක සභාවේ සාමාජිකයින් අතරින් පත් කරන මෙම ව්‍යවස්ථාවේ 6.2.i අනු ව්‍යවස්ථාවේ සඳහන් නිලධාරීන් සංඛ්‍යාවට වඩා තුනකින් අඩු සාමාජිකයින් (X -3).

vi. අවශ්‍ය අවස්ථා වලදී පක්ෂයේ අනුබද්ධ සංවිධාන නියෝජනය කරමින් දස දෙනෙකුට (10) නොවැඩි පිරිසක් නිරීක්ෂණ සභිකයින් ලෙස කැඳවීමට සභාපතිවරයාට බලය තිබේ. මෙම නිරීක්ෂණ සභිකයින්ට ඡන්ද බලය හිමි නොවේ

vii. පක්ෂයේ සභාපතිවරයා වෙත නොදන්වා මධ්‍යම කාරක සභාවේ රැස්වීම් වාර තුනකට (03) නොකඩවා සහභාගී නොවන ඕනෑම අයෙකුගේ මධ්‍යම කාරක සභා සාමාජිකත්වය නිරායාසයෙන්ම අහෝසි වෙයි.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

(9)

## 7.2 මධ්‍යම කාරක සභාවේ බලතල හා වගකීම්

i. මධ්‍යම කාරක සභාව පක්ෂයේ උත්තරීතර මණ්ඩලය වන අතර, මෙම ව්‍යවස්ථාවේ සඳහන් නොවන ඕනෑම කරුණක් හෝ වැදගත් දේශපාලනික කරුණක් පිළිබඳව හෝ මධ්‍යම කාරක සභාවේ තීරණය එකී කරුණට අදාළව අවසානාත්මක වන්නේය.

ii. පක්ෂයේ විනය සහ සංවිධාන ව්‍යුහය ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසු හා කාර්යක්ෂම පියවර ගැනීම මධ්‍යම කාරක සභාවේ නිත්‍ය වගකීම වන්නේය.

iii. පක්ෂයේ මූල්‍ය කටයුතු සඳහා මධ්‍යම කාරක සභාව විසින් භාණ්ඩාගාරිකගේ ප්‍රධානත්වයෙන් යුතු මූල්‍ය කමිටුවක් පත් කළ යුතුය. පක්ෂයේ මූල්‍ය කමිටුව සභාපතිවරයාගේ සෘජු උපදෙස් අනුව කටයුතු කළ යුත්තේය.

iv. පක්ෂය ඉදිරිපත් වන ඕනෑම මැතිවරණයකදී ඒ ඒ මැතිවරණයට අදාළව පක්ෂයේ විධායක සභාව විසින් සම්මත කර ඉදිරිපත් කරන "මැතිවරණ ප්‍රකාශනය" මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ලැබීමෙන් පසු පක්ෂයේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ලෙස සක්‍රිය වන්නේය.

v. පක්ෂ සභාපතිවරයාගේ යෝජනා අනුව කාලානුරූපව අවශ්‍යය වන පරිදි පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ නිලධාරීන් සංඛ්‍යාව වෙනස් කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

vi. ලේකම්වරයාගේ ලිඛිත උපදෙස් පරිදි පක්ෂයේ සාමාජිකයෙකු පිළිබඳව පත් කෙරෙන විනය පරීක්ෂණයකින් ලබාදෙන විනය නිර්දේශ අනුව එකී සාමාජිකයා පක්ෂයෙන් නෙරපීම, නිදොස් කොට නිදහස් කිරීම හෝ වෙනත් සුදුසු ආකාරයකට දඬුවමක් පැනවීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වෙයි.

vii. පක්ෂයේ ඕනෑම සංවිධානයක හෝ කමිටුවක කාර්යභාරයන් සහ වගකීම් තීරණය කිරීමේ බලය මධ්‍යම කාරක සභාව සතු වෙයි.

viii. මෙම ව්‍යවස්ථාවේ සඳහන් නොවන අවස්ථාවෝචිත පරිදි විවිධ විෂයන්ට අදාල කමිටු පක්ෂ සභාපතිවරයාගේ යෝජනා පරිදි පිහිටුවීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

ix. පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ පුරප්පාඩුවක් ඇති වූ විට මධ්‍යම කාරක සභිකයින් අතරින් අයෙකු මිළඟ නිලවරණය දක්වා එකී පුරප්පාඩු වූ තනතුරට පත්කර ගැනීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

x. මධ්‍යම කාරක සභාවේ සාමාජිකයින්ගෙන් 1/3 කට නොඅඩු පිරිසක් විසින් අත්සන් කර ලේකම්වරයා වෙතින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් අනුව, එකී ලිපිය තමන් වෙත ලැබී දින දාහතරක් (14) ක් ගත වීමට පෙර, ලේකම්වරයා විසින් මධ්‍යම කාරක සභාවේ විශේෂ රැස්වීමක් කැඳවිය යුතුය. එසේ ලේකම්වරයා වෙතින් කරනු ලබන ඉල්ලීමෙහි සහ ලේකම්වරයා විසින් විශේෂ රැස්වීම කැඳවනු ලබන ලිපියෙහිද, එකී විශේෂ රැස්වීම කැඳවීමට අදාළ හේතුව නිශ්චිතව සඳහන් විය යුතුය. එලෙස කැඳවන විශේෂ රැස්වීමකදී, අදාළ කරුණ පිළිබඳව පමණක් සාකච්ඡා කිරීම හෝ තීන්දු ගැනීම කළ යුත්තේය.

xi. පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන සඳහා පක්ෂය නියෝජනය කරමින් පත් වී සිටින සියලු මහජන නියෝජිතයින් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන විශේෂ මාසික දායකත්ව මුදලක් පක්ෂයට ගෙවිය යුතුය. පක්ෂයේ විධායක සභිකයන් සඳහා ද විශේෂ දායකත්ව මුදලක් මධ්‍යම කාරක සභාව විසින් තීරණය කර විධායක සභා රැස්වීමට සහභාගී වීමට පෙර එකී මුදල ගෙවිය ලෙස ඔවුන් වෙත දැනුම් දිය යුතුය.

<u>8 වන වගන්තිය</u>

සභාපතිවරයා සතු බලතල හා කාර්යයන්

i. පක්ෂ ව්‍යවස්ථාවේ නිර්දිෂ්ඨ බලතල ක්‍රියාත්මක කිරීම.

ii. මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ඇතිව හෝ ආවරණ අනුමැතියට යටත්ව වෙනත් දේශපාලන පක්ෂ හෝ සංවිධාන සමග සන්ධානගත වීමට හෝ එක්ව කටයුතු කිරීමට හෝ ඒ පිළිබඳව සාකච්ඡා කිරීමට සභාපතිවරයාට බලය තිබේ.

iii. පක්ෂයේ මධ්‍යම කාරක සභාව ඇතුලුව ව්‍යවස්ථාපිත ඕනෑම සංවිධානයක විශේෂ රැස්වීම් කැඳවීමේ බලය සභාපතිවරයා සතු වෙයි. සභාපතිවරයා විසින් කැඳවනු ලබන මෙම ඕනෑම විශේෂ රැස්වීමක ගණ පූර්ණය අදාළ සංවිධානයේ සාමාජිකත්වයෙන් 1/4 කි.

iv. පක්ෂයේ කීර්ති නාමයට, උන්නතියට හෝ පැවැත්මට හානිදායකවන බවට පක්ෂයේ සභාපතිවරයාට හැගෙන ඕනෑම සාමාජිකයෙකුගේ සාමාජිකත්වය හෝ පක්ෂයේ ව්‍යවස්ථාපිත සංවිධානයක් නම් එහි කටයුතු හෝ අත්හිටුවීමට පක්ෂයේ සභාපතිවරයාට බලය තිබේ.

v. ඉහත iv. උප වගන්තියේ සඳහන් පරිදි සභාපතිවරයා විසින් කරනු ලැබූ අත්හිටුවීම පිළිබඳව අදාළ අත්හිටුවීමෙන් පසු පැවැත්වෙන පක්ෂයේ ප්‍රථම



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

මධ්‍යම කාරක සභා රැස්වීමට සභාපතිවරයා විසින් වාර්තා කළ යුතුය. ඒ අනුව මධ්‍යම කාරක සභාව විසින් ඊට අදාළ විනය කටයුතු ආරම්භ කිරීම සහ හෝ පුරප්පාඩු තනතුර පුරවා ගැනීම ආදි කටයුතු එකී රැස්වීමේදීම තීරණය කර අදාළ පියවර ගත යුතුය.

vi. මැතිවරණ කොට්ඨාශ සම සංවිධායකවරුන්, දිස්ත්‍රික් සංවිධායකවරුන් සහ පළාත් පාලන බලප්‍රදේශ සංවිධායකවරුන් පත් කිරීමේ සහ ඉවත් කිරීමේ පූර්ණ බලය සභාපතිවරයා සතු වෙයි.

vii. මෙම ව්‍යවස්ථාවේ 4.2 වගන්තිය ප්‍රකාරව සභාපතිවරයා විසින් පත් කරනු ලබන ආසන සංවිධායකවරුන් හේතු නොදක්වා ඉවත් කිරීමේ බලය ද සභාපතිවරයා සතු වෙයි.

viii. සියලුම වියදම් වවුචර්පත් සඳහා සභාපතිවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු අතර රු. 50,000/- ට වැඩි ගෙවීම් චෙක්පත් සඳහා සභාපතිවරයා සහ භාණ්ඩාගාරිකගේ අත්සන් අනිවාර්ය වෙයි.

ix. පක්ෂය ප්‍රවර්ධනයට අදාළව විවිධ විෂයයන් හෝ ක්‍රියාකාරකම් පැවරීමටත්, පක්ෂයේ ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා අවශ්‍ය පුද්ගලයින් පත් කිරීමටත් සභාපතිවරයාට බලය තිබේ.

x. පක්ෂයේ අනු සංවිධාන සියල්ලෙහිම සභාපතිත්වය පක්ෂයේ සභාපතිවරයා විසින් දරනු ලබන අතර, සෑම අනුසංවිධානයක් සඳහාම නියෝජ්‍ය සභාපතිවරයෙකු පත්කර ගත යුතුය.

## 9 වන වගන්තිය

### විනය මණ්ඩලය

i. පක්ෂය තුළ දැඩි විනයක් පවත්වාගෙන යාමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම සඳහා මධ්‍යම කාරක සභාව විසින් හත් දෙනෙකුගෙන් (07) යුතු විනය මණ්ඩලයක් පත් කළ යුතුය. මේ විනය මණ්ඩලයේ වගකීම් සහ කාර්යභාරය, ඒ ඒ විනය පරීක්ෂණය සඳහා පත් කරන සාමාජික සංඛ්‍යාව පක්ෂ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලැබේ. අවශ්‍ය අවස්ථාවකදී විනය මණ්ඩල සාමාජිකයන් ඉවත් කිරීම හෝ සහ නව සාමාජිකයින් පත් කිරීමේ පූර්ණ බලයද මධ්‍යම කාරක සභාව සතු වෙයි.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

6

ii. පක්ෂයේ ඕනෑම නිලධාරියෙකු හට පක්ෂයට අදාළව ලැබෙන ඕනෑම ලිපියක් හෝ තොරතුරක් පිළිබඳව වහාම පක්ෂයේ සභාපතිවරයා දැනුවත් කළ යුතුය. අදාළ ලිපිය හෝ තොරතුරු පිළිබඳව ක්‍රියාත්මක වීම සිදු විය යුත්තේ සභාපතිවරයාගේ උපදෙස් පරිදි වන අතර එසේ නොමැතිව පක්ෂයට අදාළව කිසියම් කටයුත්තක් කිරීම පක්ෂයේ විනය කඩ කිරීමක් වෙයි.

## 10 වන වගන්තිය

සාමාජිකත්වය

### 10.1 සාමාජිකත්ව වර්ග

නව ලංකා නිදහස් පක්ෂයේ සාමාජිකත්වය ලබා ගැනීම දෙආකාරයකින් කළ හැකිය.

i. සාමාන්‍ය සාමාජිකත්වය
ii. විශේෂ සාමාජිකත්වය

### 10.2 සාමාජිකත්වය ලබා ගැනීම

i. ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.

ii. වයස අවුරුදු දහ අට (18) සම්පූර්ණ වී සිටිය යුතුය.

iii. සාමාජිකත්වය අයදුම්පතක් පුරවා, පක්ෂයේ මැතිවරණ කොට්ඨාශ සංවිධායකට හෝ ප්‍රධාන කාර්යාලයට භාරදීමෙන් සාමාජිකත්වය අයදුම්කල හැකිය.

iv. අයදුම්පත අනුමත වූ බව දැනුම් දුන් විට වාර්ෂික සාමාජික මුදල් ගෙවිය යුතුය. සාමාජික මුදල් ගෙවූ දිනයේ සිට සාමාජිකත්වය සක්‍රිය වෙයි.

v. අවුරුද්දේ ඕනෑම දිනක පක්ෂ සාමාජිකත්වය ලැබිය හැකිය. එහෙත් වාර්ෂික සාමාජිකත්වය සෑම වසරකම දෙසැම්බර් 31 දිනෙන් අවසන් වේ. ඒ අනුව සෑම වසරකම ජනවාරි 1 දින සිට නව වසර සඳහා සාමාජික ගාස්තු ගෙවා සාමාජිකත්වය අලුත් කර ගත යුතුය.

vi. පක්ෂ සභාපතිගේ උපදෙස් මත විශේෂිත පුද්ගලයන්ට විශේෂ සාමාජිකත්ව ලබා දීමට ලේකම්වරයාට බලය තිබේ.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

## 10.3 සාමාජික ගාස්තු

i. පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තිරණය කරනු ලබන මුදලක් වාර්ෂික සාමාජික ගාස්තු ලෙස සෑම සාමාජිකයෙකු විසින්ම ගෙවිය යුතුය.

ii. පක්ෂයේ පාර්ලිමේන්තු, පළාත් සභා සහ පළාත් පාලන ආයතන වල නියෝජිතයන් ලෙස පත්වන සියලු දෙනා පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තිරණය කරනු ලබන දායකත්ව සාමාජික ගාස්තුවක් මාසිකව ගෙවිය යුතුය.

iii. විධායක සභික සියලු දෙනාම පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තිරණය කරනු ලබන අතිරේක දායකත්ව සාමාජික ගාස්තුවක් එක් රැස්වීමට සහභාගී වීමට පෙර ගෙවිය යුතුය.

iv. ඉහත ii. සහ iii. හි සඳහන් දායකත්වය සාමාජික ගාස්තු ගෙවීමට පෙර i. හි සඳහන් වාර්ෂික සාමාජික ගාස්තුව ගෙවා තිබීම අනිවාර්ය වෙයි.

## 10.4 සාමාජිකත්වයේ වගකීම්

i. පක්ෂයේ ව්‍යවස්ථාව අනුව කටයුතු කිරීමට බැඳී සිටියි.

ii. පක්ෂයේ ප්‍රතිපත්ති හා අරමුණු ආරක්ෂා කරමින් ඒ අනුව කටයුතු කිරීමටත් පක්ෂයේ මධ්‍යම කාරක සභාවේ තීන්දු සහ තිරණ අනුව කටයුතු කිරීමටත් බැඳී සිටියි.

iii. ජනතාව අතර පක්ෂය අප්‍රසාදයට හෝ අපකීර්තියට පත්වීම වැළැක්වීමටත්, පක්ෂයේ ජනප්‍රියත්වය වර්ධනය කිරීම සඳහා කටයුතු කිරීමටත් බැඳී සිටියි.

iv. ඕනෑම මැතිවරණකදී පක්ෂය විසින් ඉදිරිපත් කරන අපේක්ෂකයින්ට සහයෝගය දෙමින්, ඔවුන් ජයග්‍රහණය කරවීමට කටයුතු කිරීමටත්, පක්ෂයේ අපේක්ෂකයන් ඉදිරිපත් නොකරන අවස්ථාවකදී පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් ගනු ලබන තිරණ පරිදි කටයුතු කිරීමටත් බැඳී සිටියි.

v. ඉහත i, ii, iii, iv අනු වගන්ති වල සඳහන් කරුණු අවබෝධ කර ගනිමින් විනයවත් පක්ෂ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට සියලු සාමාජිකයින් බැඳී



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

සිටියි. එකී ඕනෑම කොන්දේසියක් පැහැර හැරීම හෝ කඩ කිරීම පක්ෂයේ සිය සාමාජිකත්වය අහෝසි වන විනය වරදක් බව සියලු සාමාජිකයෝ දැනුම්වත්ව සිටිති.

## <u>11 වන වගන්තිය</u>

### උපදේශක සභාව

ජාතික ප්‍රතිපත්ති සම්පාදනයට සහ හෝ ජාතික මෙන්ම ජාත්‍යන්තර වැදගත්කමකින් යුත් කටයුතු සඳහා බුද්ධිමය දායකත්වයක් ලබා ගැනීමට විවිධ ක්ෂේත්‍ර වල ප්‍රවීණයන්ගෙන් සමන්විත උපදේශක මණ්ඩලයක් පත්කර ගත හැකිය. මධ්‍යම කාරක සභාවේ අනුමැතියට යටත්ව දස දෙනෙකුට (10) වැඩි නොවන පිරිසක් ඒ සඳහා පත්කර ගැනීමට සභාපතිවරයාට හැකිය.

## <u>12 වන වගන්තිය</u>

### නිලවරණ

වාර්ෂිකව හෝ පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් තීරණය කරනු ලබන කාලයක් තුළ හෝ පක්ෂයේ ව්‍යවස්ථාපිත සංවිධාන වල නිලවරණ පවත්වා නිලධාරීන් පත් කර ගත යුතුය. නිලවරණය පැවැත්වීම පිළිබඳව දැන්වීම් එකී දිනයට දින දාහතරකටවත් (14) පෙර දැනුම් දිය යුතුය.

## <u>13 වන වගන්තිය</u>

### නව ලංකා නිදහස් පක්ෂයේ මහ සම්මේලනය

i. පක්ෂයේ මහ සමුලුවක් පැවැත්විය යුතු දින වකවානු තීරණය කිරීමත්, එයට සහභාගී කරගත යුතු පිරිස කවුරුන්ද යන්න තීරණය කිරීමත් පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් කළ යුතුය.

ii. පක්ෂයේ මහ සමුලුව පැවැත්වීමේ කටයුතු සංවිධානය සඳහා පක්ෂ ලේකම්වරයාගේ ප්‍රධානත්වයෙන් යුතු කමිටුවක් මධ්‍යම කාරක සභාව විසින් පත් කළ යුතුය.

iii. පක්ෂයේ මහ සමුලුවේ මුලසුන පක්ෂයේ සභාපති විසින් දැරිය යුතුය.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

iv මහා සමුලුවට ඉදිරිපත් කරන සියලු යෝජනා ඊට පෙර මධ්‍යම කාරක සභාව විසින් අනුමත කර තිබිය යුතුය.

v. පූර්වගාමී මහා සම්මේලනයේ සිට ගතව ඇති කාලය තුළ පක්ෂයේ ප්‍රවර්ධන සහ ජයග්‍රහණ පිළිබඳ වාර්තාවක් පක්ෂ ලේකම්වරයා විසින් මහා සමුලුවට ඉදිරිපත් කළ යුතුය.

## 14 වන වගන්තිය

### නව ලංකා නිදහස් තරුණ සංවිධානය

පක්ෂයේ තරුණ සංවිධානය සඳහා සුදුසු ව්‍යවස්ථාවක් සකස් කර පක්ෂ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

## 15 වන වගන්තිය

### නව ලංකා නිදහස් කාන්තා සංවිධානය

පක්ෂයේ කාන්තා සංවිධානය සඳහා සුදුසු ව්‍යවස්ථාවක් සකස් කර පක්ෂ මධ්‍යම කාරක සභාවේ අනුමැතිය ලබාගත යුතුය.

## 16 වන වගන්තිය

### පක්ෂයේ මූල්‍ය කටයුතු

i. පක්ෂයේ මුදල් වර්ෂය සෑම වසරකම අප්‍රේල් 1 දින සිට ඊළඟ වසරේ මාර්තු 31 දින දක්වා වෙයි.

ii. පක්ෂයේ මූල්‍ය කටයුතු පක්ෂ භාණ්ඩාගාරිකගේ ප්‍රධානත්වයෙන් මධ්‍යම කාරක සභාව විසින් පත්කරන මූල්‍ය කමිටුව වෙත පැවරෙයි.

iii. රුපියල් 50,000/- ක් දක්වා වියදම් වවුචර්පත් අනුමත කිරීම සහ චෙක්පත් දෙවන අත්සන් කිරීම පක්ෂ ලේකම්වරයා විසින් කළ යුතු අතර රුපියල් 50,000/- ඉක්මවන සෑම වියදම් වවුචර් පතක්ම සභාපතිවරයා විසින් අනුමත කර එම චෙක්පත්වල දෙවන අත්සන තැබීම සභාපතිවරයා විසින් කළ යුතුය.



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

iv. පක්ෂයේ සියලුම වියදම් ගෙවීම් වල සළඹුු අත්සන භාණ්ඩාගාරික විසින් කළ යුතුය.

## 17 වන වගන්තිය

පොදු විධිවිධාන

i. මෙම සංශෝධිත ව්‍යවස්ථාවන් සම්මත කරන අවස්ථාව වන විට පක්ෂයේ සාමාජිකත්වය දරණ සියලුදෙනාම මෙම නව ව්‍යවස්ථාව යටතේද නව ලංකා නිදහස් පක්ෂයේ නීත්‍යානුකූල සාමාජිකයින් සේ පිළිගැනෙයි.

ii. මීළඟ නිලවරණයකින් නව නිළධාරීන් පත්කරන තෙක් පක්ෂයේ පැරණි නිලධාරී මණ්ඩලය ක්‍රියාත්මක වෙයි.

iii. පක්ෂයේ නිලධාරී මණ්ඩලයේ කිසියම් පුරප්පාඩුවක් ඇති වුවහොත් මීළඟ නිලවරණය දක්වා එම පුරප්පාඩු පිරවීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

iv. ඒ ඒ මැතිවරණ දිස්ත්‍රික්ක වල මැතිවරණ බල ප්‍රදේශ තීරණය කිරීමට මධ්‍යම කාරක සභාවට බලය තිබේ.

v. පක්ෂයේ නිර්මාතෘ, ආරම්භක සභාපතිතුමා ඔහුගේ කැමැත්ත ඇතිනාක් කල් පක්ෂයේ සභාපති පදවිය දරන්නේය.

vi. ශ්‍රී ලංකාවේ විශ්‍රාමික ජනාධිපතිවරු පක්ෂයේ අනුශාසකවරුන් ලෙස මධ්‍යම කාරක සභාව විසින් පත්කරගත හැකිය.

vii. පක්ෂ ව්‍යවස්ථාවේ සඳහන් ඕනෑම ව්‍යවස්ථාපිත සංවිධානයක සිදු කෙරෙන ඡන්ද විමසීමකදී පක්ෂව හා විපක්ෂව ඡන්ද ලැබීම සම තත්වයේ වුවහොත් සභාපතිවරයාගේ තීරක ඡන්දයෙන් අදාළ තීරණය ගත හැකිය.

viii. මෙහි ව්‍යවස්ථාපිත ඕනෑම සංවිධානයක ගණ පූර්ණය ඒ වන විට එකී සංවිධානයේ සාමාජිකත්වයෙන් 1/3 කි. එහෙත් පක්ෂයේ සභාපතිවරයා විසින් කැඳවන විශේෂ රැස්වීමක ගණ පූර්ණය ඒ වන විට එකී සංවිධානයේ සාමාජිකත්වයෙන් 1/4 කි.

ix. මෙම ව්‍යවස්ථාවේ සඳහන් නොවන ඕනෑම කරුණක් හෝ ක්‍රියාකාරකමක් පිළිබඳව පක්ෂ ව්‍යවස්ථානුකූල අර්ථ නිරූපණයක් අවශ්‍ය වූ ඕනෑම අවස්ථාවක ඒ පිළිබඳව පක්ෂයේ මධ්‍යම කාරක සභාව විසින් දෙනු ලබන තීරණය එකී



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය

කරුණට හෝ ක්‍රියාකාරකමට අදාළව පක්ෂ ව්‍යවස්ථානුකූල තත්වය පිළිබඳව අවසානාත්මක වෙයි.

x. පක්ෂයේ ව්‍යවස්ථාපිත ඕනෑම සංවිධානයක නිලධාරි මණ්ඩලය පත් කිරිමේදි ඒවායෙහි කාන්තා නියෝජනය 30% ක් සහ තරුණ නියෝජනය 40% ක් වන ලෙස පත්කර ගැනිමට සියලුදෙනා හැකිතාක් උනන්දු විය යුතුය.

xi. මෙම ව්‍යවස්ථාවේ දෙමළ හෝ ඉංග්‍රිසි පරිවර්තනයන් සහ මෙම ව්‍යවස්ථාව අතර කිසියම් හෝ පරස්පරතාවයක් ඇතිවුවහොත් පක්ෂයේ කටයුතු සඳහා නිතිමය වශයෙන් පිළිගනු ලබන්නේ මෙම සිංහල ව්‍යවස්ථාවය .

සිද්ධි රස්තු !



කුමාර වෙල්ගම
පාර්ලිමේන්තු මන්ත්‍රී
සභාපති
නව ලංකා නිදහස් පක්ෂය